පච්චිලායිපල්ලෙයි ප්‍රාදේශිය සභාව

කිලිනොච්චි දිස්ත්‍රික්කය

-------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 15 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පච්චිලායිපල්ලෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ අඩුපාඩු පහත සඳහන් වගුවෙහි ආදායම් සහ වියදම් යටතෙහි දක්වා ඇත.

| මූල්‍ය ප්‍රකාශයන්ට ඇති බලපෑම | ආදායම් | | වියදම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. |
| වැඩියෙන් දැක්වීම | 01 | 231,870 | 01 | 231,870 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.39,200 ක් වූ ගනුදෙනුවක් විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.1,910,691 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම අතිරික්තය රු.338,519 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල නොකිරීම නිසා අයවැයගත සහ තථ්‍ය ආදායම අතර රු.2,304,512 ක වෙනසක් සහ අයවැයගත සහ තථ්‍ය වියදම අතර රු.1,507,139 වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

--------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

---------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි, ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපණම් හා බදු | - | 03 | - |
| බදු කුලී | 4,612 | 4,489 | - |
| බලපත්‍ර ගාස්තු | 200 | 283 | - |
| වෙනත් ආදායම් | 17,950 | 20,291 | 1,714 |
| | 22,762 | 25,006 | 1,714 |

2.3.2 ආදායම් අහිමි විම

-----------------------

සභා සීමාව තුලවු දේපොළ තක්සේරු නොකිරිම නිසා සභාවට එහි ආදායම් අහිමි වි තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

----------------

2010 සිට 2013 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ රු.989,350 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණී.

2.4 අනුකූල නොවිම්

----------------------

නීති, රීති, සහ රෙගුලාසි වලට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදීයට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 41/90 හා 1990 ඔක්තෝබර් 10 දිනැති චක්‍රලේඛය | - | සභාවේ වාහන 07 ක ඉන්ධන පරිභෝජනය පරික්ෂා කර නොතිබුණි. |
| (ආ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක ඩීඑම්ඒ/2009(1) සහ 2009 ජුනි 09 දිනැති විගණනය සහ කළමනාකරණ චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය තුල රැස්වීම් 4 ක් පැවැත්විය යුතු නමුත් එසේ රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 | - | ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ආදායම් අයකර නොගැනිම

2.5.1 අංක 1597/8 හා 2009.04.17 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය පරිදි සභා සීමාව තුල හිටි විදුලි සංදේශ කුළුණු වෙනුවෙන් අයවිය යුතු පහත සඳහන් ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

i. සංවර්ධන බලපත්‍ර
ii. ප්‍රාථමික සැලසුම්
iii. අනුකූලවීම් සහතිකය
iv. ආවරණ අනුමැතිය

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

ආදායම් ණයගැතියන් රු.114,097 ක් මෙම වාර්තාවේ දින දක්වාම අයකරගත යුතුව පැවතුණි.

2.6 වත්කම් කළමනාකරණය

-------------------------------

2.6.1 භාවිතා නොකළ ජංගම ගිණුම් ශේෂය

---------------------------------------------

සභාවේ මුදල් රු.17,853 ක් වර්ෂ 5 කට අධික කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන ලංකා බැංකු ජංගම ගිණුමක නිෂ්ක්‍රියව තිබුණු බව විගණනයේදි නිරික්ෂණය විය.

2.6.2 මානව සම්පත්

-------------------

කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 15 ක් නිසා සභාවේ සංවර්ධන සැලසුම් වලට බලපෑමක් සිදු වි ඇති අතර සභාව මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2.6.3 අයිතිය මාරු කිරිම

------------------------

වාහන 16 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණු බව විගණනයේදි නිරික්ෂණය විය.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

2.7.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

------------------------------------------

සභාව විසින් ක්‍රියාත්මක කළයුතු වටිනාකම රු.784,750 ක් වු ව්‍යාපෘති 8 ක් මෙම වාර්තාවේ දින දක්වා නිම කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

---------------------------

ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොපැවතුණි.

2.9 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

කාබනික පොහොර ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ වෙනුවට එකතු කරනු ලබන කැළි කසල ගිනි තබා හෝ පස්යට වලදමා තිබුණි.

3. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

i. ආදායම් රැස්කිරිම
ii. ස්ථාවර වත්කම්
iii. ගිණුම්කරණය
iv. කාර්ය මණ්ඩලය
v. විවිධ තැන්පතු
vi. අයවැය ලේඛණය
vii. ගබඩා
viii. මිළදී ගැනිම් පරිපාටිය